සිංහල භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය

**සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර**

**ර/බළ/ සමනලවත්ත විද්‍යාලය**



ශ්‍රී ලංකාවේ කඳුවැටි අතරින් සමනොළ කන්දට හිමි වන්නේ විශේෂ ස්ථානයකි .මෙම කඳුවැටිය අතීතයේ පටන් ලාංකික ජනයාගේ ඇදහිලි හා විශ්වාස සමග බැඳී පවතී.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත සැළලිහිණි සන්දේශයේ ශ්‍රීපාදස්ථානය පිහිටි සමනොළ කන්ද මෙලෙසින් වර්ණනා කර ඇත .

සුරරද සමන් සමගින් සුරගන එවර

පැහැනද මදාරා පරසතු මල් පතර

කැර පුද වදින මුනි සිරිපා තඹර



සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර



ශ්‍රී ලංකාවේ ජීවත් වන සෑම ජන වර්ගයකටම අයත් විශ්වාසයන් සමනොළ කන්ද හා සම්බන්ධව පවතී.

බුදුරජාණන් වහන්සේ තෙවන වරට ලංකාවට වැඩම කළ අවස්ථාවේ සමන්ත කූටයට (සමනොළ කන්ද මුදුනට) වැඩම කරන ලෙස සුමන සමන් දෙවියන් ආයාචනය කරන ලදී.

ඒ අනුව බුදුන් වහන්සේ සමන්ත කූටයට වැඩම කර පා සටහන පිහිටවූ බව බෞද්ධයන්ගේ විශ්වාසය යි.

ඉස්ලාම් සහ ක්‍රිස්තු භක්තිකයන්ට අනුව සමනොළ කන්ද මුදුනේ ඇති පා සටහන ඔවුන්ගේ ආදි පුරුෂයා වූ ආදම්ගේ ය.

ශිව දෙවියන් නැටුමක් වෙනුවෙන් සුර ලොවින් මිනිස් ලොවට පැමිණ සමනොළ කන්දේ පා සටහන තැබූ බව හින්දු භක්තිකයන්ගේ විශ්වාසය යි.

කෙසේ වුවද මහාවංසයේ 32 වන පරිච්ඡේදයේ සඳහන් වන්නේ සමනොළ කන්ද බුදුන් වහන්සේට මෙන්ම සුමන සමන් දෙවියන්ට පිදූවක් බව යි.

එළාර රජුගේ දීඝජන්තු නම් යෝධයා සුමන කූටයේ පිහිටි ආකාශ චෛතියට රතු සේද රෙද්දක් පූජා කළ බව මනෝරථපූරණී නම් ග්‍රන්ථයේ සඳහන් වේ.

දුටුගැමුණු රජතුමා මරණ මන්චකයේ සිට තමා කළ පින්කම් මෙනෙහි කරද්දී සමනොළ කන්දේ වැඩ සිටි මලියදේව නම් හිමි නමකට දානය පූජා කළ බවත් එය රහතන් වහන්සේලා නවසිය නමක් වැළඳූ බවත් සඳහන් වේ.

සිරිපා වාරය ආරම්භ වන්නේ උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයෙනි. එය අවසන් වන්නේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනයෙනි .



තුන් සරණේ කවි කියමින් සමනොළ කන්ද තරණය කරන සැදැහැවතුන් ව්‍යවහාර කරන වචන සමූහයකි.

සිරිපා කන්ද නැගීම - කරුණා කිරීම

ගමන් මල්ල - සැහැල්ලුව

තදබදයක් ඇති වූ විට - දෙන්න අපට සන්හිඳේ

වන්දනා කණ්ඩායම - නඩය

කණ්ඩායම් නායකයා - නඩේ ගුරා

ප්‍රථම වතාවට සිරිපා වන්දනා කරන්නා - කෝඩුකාරයා

අතීතයේ විසූ රජවරුන් ශ්‍රීපාදස්ථානයට ගම්වර පූජා කළ බව අඹගමු සෙල්ලිපිය , ගිලීමලේ සෙල්ලිපිය හා ශ්‍රී නිශ්ශංකමල්ල සෙල්ලිපිය යන සෙල්ලිපිවල සඳහන් වේ.

විදේශිකයන් ද ශ්‍රීපාදස්ථානය ගැන සටහන් තබා ඇත.

මහා ඇලෙක්සැන්ඩර් රජු

අරාබි ජාතික සුලෙයිමාන්

ඉබන්බතුතා

පෘතුගීසි ජාතික ඔඩාරොසෝ බාර්බොසා

හියුන්සාන් භික්ෂුව

රොබට් නොක්ස්

ඇලන් වෝල්ටර්ස්

අමසන් ටෙනන්ට්

විලියම් ස්කීන් ඒ අතර වේ.

- මෙම පාඩමේ ලිඛිත අභ්‍යාස සහ ප්‍රායෝගික අභ්‍යාස කරන්න .